# ශ්‍රී ලාංකේය බෞද්ධ සංස්කෘතිය කෙරෙහි දේව සංකල්පයේ බලපෑම කෙබඳුවීද යන්න පිළිබඳ විමර්ෂණාත්මක අධ්‍යයනයක්

බණ්ඩාර කේ.එම්.පී.එම්. සහ වනසිංහ පී.එස්.පී.

ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය, මිහින්තලේ

madusankap329@gmail.com

**සාරසංක්ෂේපය**

ආගම හා දේව විශ්වාසයන් ජනිතවීමේ මූලබීජය මිනිසාගේ චෛතසික දුබලතාවයත්, ඒ සමඟ උපදින භය හා අසරණභාවයත් ය. එකී තත්වය තුළ ශ්‍රී ලාංකේය බෞද්ධ සංස්කෘතිය කෙරෙහි දේව සංකල්පයේ බලපෑම කෙබඳුවී ද යන්න පිළිබඳව විමර්ෂණාත්මකව අධ්‍යයනය කිරීම පර්යේෂණ ගැටළුවයි. බෞද්ධ සමාජය කෙරෙහි දේව සංකල්පයේ වූ බලපෑම විමර්ශණය, දේව සංකල්පයේ වූ ලාංකේය සමාජීය මුල්බැසගැනීම විමර්ෂණය පර්යේෂණයේ අරමුණු වේ. පර්යේෂණ ක්‍රමවේදය ලෙස ගුණාත්මක පර්යේෂණ ප්‍රවේශයේ එන ඓතිහාසික පර්යේෂණ ක්‍රමවේදය භාවිතා කරන ලදී. ප්‍රාග් මහින්ද යුගයේ දෙවියන් ඇදහීම මෙරට ප්‍රමුඛ ආගමික අංගය වුවද ක්‍රි.පූ. තුන්වන සියවසේදී ලාංකේය සමාජයට බෞද්ධ සංකල්පය අන්තර්ග්‍රහණය වීමත් සමඟ දේව වන්දනය ක්‍රමයෙන් වියැකී යෑම සිදුවිය. අනුරාධපුර යුගයේ භික්ෂු සමාජයේ වූ විභේදනයන් හා එම අවධියේ මෙරට දකුණු ඉන්දිය බලය ව්‍යාප්ත වීම මත බෞද්ධ සමාජයට දේව විශ්වාසය යළි අන්තර්ග්‍රහණය වී ඇත. ක්‍රි.පූ. දෙවන සියවසේදී පමණ කරන ලද ස්ථූපයන්හි වාහල්කඩවල ලක්වැසියන් අඳින ලද නාගාදීන්ගේ හා උසස් දෙවිවරුන්ගේ රූප කැටයම් කර තිබීම බෞද්ධ කලාකෘති තුළට දෙවියන් අන්තර්ග්‍රහණය වීමේ ප්‍රාථමික අවස්ථාව වේ. දෙවිවරුන් ඇදහීමේ වැදගත් අංගයක් වූ පූජා නැටුම්, සංගීතය හා නාට්‍ය භාතිකාභය රජසමයේ ස්ථූපවලට සම්බන්ධ කරගත්බව දීපවංසයේ සඳහන් වේ. දෙවියන් ඇදහීමේ ශිල්ප ක්‍රම අනුරාධපුර යුගය තුළදීම ක්‍රමයෙන් බෞද්ධ සමාජයට අන්තර්ග්‍රහණය වී ඇත. මහායානවාදය සමඟ ඉදිරියට පැමිණි බෝධිසත්ව සංකල්පයද දේව විශ්වාසය තහවුරු කරන්නකි. පොළොන්නරු අවධියේදී දක්ෂිණ භාරතීය දෙවිවරුන්ට බෞද්ධ භක්තියක් ආරෝපණය කොට ඇදහීම වර්ධනය විය. දඹදෙණි යුගය වනවිට බෞද්ධයන්ගේ දේව ඇදහීම රාජානුග්‍රහය සහිතව සිදු වූ බව පූජාවලියේ දැක්වේ. ගම්පොළ අවධිය වනවිට රාජානුග්‍රහය සහිතව දේවාල ඉදිවීම, දේවාලවලට ගම්බිම් පූජා කිරීම, දෙවියන්ට පෙරහැර පැවත්වීම බහුල වශයෙන් සිදුවිය. විහාරස්ථාන තුළ දේවාල ඉදිකොට බුදුන් හා දෙවියන් එකම ස්ථානයක ඇදහීම ගම්පොළ යුගයේදී ආරම්භ විය. මෙම අවධියේදී දේශීය දෙවිවරුන්, මහායානික දෙවිවරුන්, හින්දු දෙවිවරුන් යනාදී නානාවිධ දෙවිවරුන් ඇදහීම සිදු කොට ඇත. කෝට්ටේ යුගයේ බුද්ධිමය පුබුදුවත් සමඟ උච්චාවචනය වූ දේව සංකල්පයේ බෞද්ධ සමාජීය තහවුරුව මහනුවර යුගයේදී සිදුවිය. ප්‍රාග් බෞද්ධ අවධියේ පටන් ලාංකේය සමාජය තුළ ආගමික ඇදහීමක් ලෙස උපන් දේව සංකල්පය බුදුදහම හා සම්මිශ්‍ර වී වර්තමානය වන විට ජනවිඥාණය හා බද්ධ වූ අනන්‍ය අංගයක් බවට පත්ව ඇත.

**ප්‍රමුඛ පද:** *දේව විශ්වාසය, ජන සමාජය, ඇදහීම, බෞද්ධයන්, අන්තර්ග්‍රහණය*